# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1521/29 – 2007 නොවැම්බර් 02 වැනි සිකුරාදා – 2007.11.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංකය 18

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12 (1) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් පහත සඳහන් කරනු ලබන සිමෙන්ති වර්ග කිසිම නිෂ්පාදකයෙකු, ආනයනකරුවෙකු, අසුරන්නෙකු, බෙදා හරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ මලු/බහාලුම් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර වලට අනුකූල වන්නේ නම් මිස සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස එකී සිමෙන්ති වර්ග නිපදවීම, ආනයනය කර භාවිතා කිරීම හෝ බෙදා හැරීම, ඇසිරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ. තව ද, සෑම සිමෙන්ති වර්ගයක ම එම නිෂ්පාදනයන්ට ආදළ ශ්‍රී ලංකා ප්‍රමිතීන් හි සඳහන් අනුරූප සූචක නාමය ( generic name ) සඳහන් විය යුතු බවට ද තව දුරටත් මෙයින් විධාන කරනු ලැබේ.

(අ) Blended Hydraulic Cements - SLS 1247

(ආ) Portland Limestone Cement - SLS 1253

(ඇ) Masonry Cement - SLS 515

(ඈ) Ordinary Portland Cement - SLS 107

මෙම විධානය 2008 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක,
වැඩ බලන සභාපති.

2007 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

11-647

1A-PG 00851-530 (2007/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.